පාතදුම්බර ප්‍රාදේශීය සභාව
මහනුවර දිස්ත්‍රික්කය

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිලිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජුලි 10 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට පාතදුම්බර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේදී නිම නොකළ ව්‍යාපෘති 4 ක වටිනාකම වූ රු.3,013,930 ක් ප්‍රාග්ධනිත කර තිබුණු අතර, කහල්ල මහජන පුස්තකාලය සංවර්ධනය සඳහා දරා තිබූ රු.148,336 ක වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. ව්‍යාපෘති 3 ක ඉඩම් ගොඩනැගිලි සංවර්ධනය සඳහා දරා තිබුණු සත්‍ය වටිනාකමට වඩා වැඩියෙන් රු.283,990 ක් ප්‍රාග්ධනිත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.2,098,375 ක් වටිනා කර්මාන්ත ණයහිමි ශේෂ 6 ක් හා රු.844,002 ක් වටිනා කර්මාන්ත ණයගැති ශේෂ 3 ක් දෙවරක් ගිණුම්ගතකර තිබුණි.

(ඇ) දේශීය ණය හා සංවර්ධන අරමුදලට 2016 දෙසැම්බර් මස වාරික ගෙවීම දෙවරක් ගිණුම්ගත කිරීම හේතුවෙන් දේශීය ණය හා සංවර්ධන අරමුදල් ගිණුමේ ශේෂය හා විවිධ ණයහිමි ගිණුමේ ශේෂය රු.263,226 ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි.

(ඈ) විවිධ ණයහිමියන් සඳහා හර විය යුතු රු.31,485 ක් විවිධ තැන්පත් ගිණුමට හර කිරීම හේතුවෙන් විවිධ ණයහිමි ශේෂය එම වටිනාකමින් වැඩියෙන් හා විවිධ තැන්පත් ගිණුමේ ශේෂය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයට අදාළව 2016 වර්ෂයේ ලැබී තිබුණු බලපත්‍ර ගාස්තු රු.25,000 ක් 2017 වර්ෂයේ බලපත්‍ර ගිණුම සඳහා බැර නොකර හර කිරීම හේතුවෙන් 2017 වර්ෂයට අදාළ බලපත්‍ර ගාස්තු රු.50,000 ක් අඩුවෙන් හා කලින් ලද ආදායම් එම වටිනාකමින් වැඩියෙන් ගිණුම්ගතකර තිබුණි.

(ඊ) 2018 වර්ෂයට අදාළව 2017 වර්ෂයේ ලැබී තිබුණු බලපත්‍ර ගාස්තු රු.34,000 ක් කලින් ලද ආදායම් ලෙස බැර නොකර හර කිරීම හේතුවෙන් කලින් ලද ආදායම් ගිණුමේ ශේෂය රු.68,000 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) 2018 වර්ෂය වෙනුවෙන් ලැබී තිබුණු රු.761,968 ක වරිපනම් ගාස්තු කලින් ලද ආදායමට බැර නොකර හර කර තිබුණි.

(ඍ) නාගරික සංවර්ධන අධිකාරි ඉතුරුම් ගිණුම් ශේෂය රු.1,246,730 ක් වුවත්, එය රු.1,134,892 ක් ලෙස ගිණුම්ගතකර තිබීම නිසා රු.111,838 ක් අඩුවෙන් දැක්වුණි.

(එ) සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන තිබුණු රු.53,040 ක් වටිනා ලී බඩු හා කාර්යාල උපකරණ ප්‍රාග්ධනීත කර නොතිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මිශ්‍ර තැන්පත් ශේෂය රු.5,658,911 ක් වුවත්, එය රු.5,800,992 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් රු.142,081 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයට අදාළ උසාවි දඩ බිල් කිරීම් රු.625,428 ක් වුවත්, පෙර වර්ෂයට අදාළ බිල් කිරීම් රු.1,196,050 ක් සමඟ රු.1,821,478 ක් ගිණුම්ගතකර තිබුණි.

(ඕ) සභාව සතු රු.300,000 ක් වටිනා එක්ස්කැවේටර් යන්ත්‍රය මෝටර් රථ හා කරත්ත ගිණුමේ සහ යන්ත්‍රෝපකරණ ගිණුමේද සටහන් කර තිබුණු අතර, මාර්ග තලනයේ වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ක) කුණ්ඩසාලේ හා පාතදුම්බර ප්‍රාදේශීය සභා දෙක ඒකාබද්ධව ක්‍රියාත්මක කරන අලුත්වත්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියේ ලාභය හෝ අලාභය ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.2 අසම්භාව්‍ය බැරකම්

----------------------

මාර්ග පුළුල් කිරීම, බැම් කඩා දැමීම, අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම හා බෝක්කු අවහිර කිරීම සම්බන්ධයෙන් සභාවට විරුද්ධව බාහිර පාර්ශවකරුවන් 19 දෙනෙකු අධිකරණයේ නඩු ගොනුකර ඇතත්, ගිණුම් සටහන් මඟින් අනාවරණය කර නොතිබුණි.

1.3.3 නොසැසඳුණු ගිණුම්

--------------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.61,841,767 ක් වූ ගිණුම් විෂයයන් 9 කට අදාළ ශේෂයන් හා උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර, රු.19,325,796 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

--------------------------------------

(අ) ලැබිය යුතු ගිණුම්

-------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 6 ක එකතු වටිනාකම රු.43,668,851 ක් විය. ඒ පිළිබඳ කාල විශ්ලේෂණයට අනුව වසර 1-5 දක්වා කාලයකට අදාළ ගිණුම් ශේෂ එකතුව රු.18,235,985 ක් විය.

(ආ) ගෙවිය යුතු ගිණුම්

--------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 4 ක එකතුව රු.50,937,302 ක් වූ අතර, ඒ පිළිබඳ කාල විශ්ලේෂණය අනුව වසර 1 ක කාලයක් ඉක්මවා තිබුණු ශේෂවල එකතුව රු.29,916,977 ක් විය.

1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.120,688,644ක් වූ ගනුදෙනු 4 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.11,949,326 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.11,993,024 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්ර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i)වරිපනම් හා බදු | 9,438,000 | 8,796,768 | 7,573,344 | 1,223,424 | 8,212,500 | 8,300,956 | 8,269,780 | 31,176 |
| (ii) කුලී | 2,401,640 | 1,712,502 | 1,546,629 | 165,873 | 2,996,800 | 1,232,840 | 1,081,837 | 151,003 |
| (iii)බලපත්‍ර ගාස්තු | 774,500 | 774,500 | 706,320 | 68,180 | 1.150,500 | 1,150,500 | 929,410 | 221,090 |
| (iv)වෙනත් ආදායම් | 29,716,800 | 29,600,278 | 20,770,759 | 8,829,519 | 28,534,500 | 28,719,384 | 24,660,637 | 4,058,747 |
| | 42,330,940 | 40,884,048 | 30,597,052 | 10,286,996 | 40,894,300 | 39,403,680 | 34,941,664 | 4,462,016 |

2.2.2 වරිපනම් හා බදු

සමාලෝචිත වර්ෂය ආරම්භයේදී රු.3,554,842 ක හිඟ ශේෂයක් පැවති අතර, වර්ෂයේ බිල් කිරීම් රු.5,580,000 ක් විය. වර්ෂයේ අය කිරීම හිඟ ශේෂයෙන් රු.1,433,214 ක් හා වර්ෂයේ බිල් කිරීම් වලින් රු.3,170,335 ක් විය. 2017 දෙසැම්බර් 31 දිනට හිඟ ශේෂය රු.4,531,292 ක් වූ අතර, එම ශේෂයෙන් වර්ෂයක කාලයක් ඉක්මවා තිබූ ශේෂවල වටිනාකම රු.2,121,628 ක් විය.

2.2.3 බදුකුලී

---------

සමාලෝචිත වර්ෂයේ ආරම්භයට තිබූ රු.388,071 ක හිඟ ශේෂයෙන් වර්ෂය තුළ අයකර තිබුණේ රු.71,790 ක් පමණි. එය හිඟයෙන් සියයට 18.5 ක් තරම් ඉතා අඩු අගයකි.

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.1,821,478 ක් හා මුද්දර ගාස්තු රු.27,641,330 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

-------------------------------

3.1 කාර්යසාධනය

------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබවිහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

-------------------

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 18 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

----------------------

පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් 10 ක් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ඇ) අපේක්ෂිත ප්‍රතිලාභ (out come) ලබා නොගැනීම

-------------------------------------------------------

ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබූ කාර්යයක් ඉටු කිරීම සඳහාරු.1,980,000 ක් වැය කර අපේක්ෂිත නිමවුම් මට්ටම (out put) අත්පත් කරගෙන තිබූ නමුත් අපේක්ෂිත ප්‍රතිලාභ (out come) අත්පත් කරගෙන නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| කර්තව්‍යය | 2017 දෙසැම්බර් 31 දක්වා වැය කළ මුදල | නිරීක්ෂණ |
| --- | --- | --- |
| | රු. | |
| කුඩුගල වෙළඳ සංකීර්ණය | 1,980,000 | මෙම වෙළඳ සංකීර්ණයේ කඩ කාමර දෙකක් 2014 දෙසැම්බර් මාසයේ සිට මේ දක්වාම ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. |

(ඇ) ක්‍රියාත්මක නොකළ කර්තව්‍යයන්

සමාලෝචිත වර්ෂයේදී රු.300,000 ක් වටිනා ව්‍යාපෘති 4 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

| කර්තව්‍යය | ඇස්තමේන්තු පිරිවැය | නිරීක්ෂණ |
|---|---|---|
| | රු. | |
| මහකැලේ කොළණියේ සිට දොරගමුව ගම් මායිම දක්වා වැටී ඇති ගම්සහා පාරේ පහළ කොටස සංවර්ධනය කිරීම | 100,000 | කර්මාන්ත ඉටු කිරීම සඳහා සුදුසු කොන්ත්‍රාත්කරුවකු හෝ අනුමත සමිතියක් ඉදිරිපත් වී නොතිබීම |
| ගලදෙණිය හකීමියා දහම් පාසල් අතුරු මාර්ගය සංවර්ධනය කිරීම. | 150,000 | - එම - |
| කහල්ල ඉහළ ගම්මැද්ද අතුරු මාර්ගයේ යොදා ඇති බෝක්කුවෙන් එන ජල පහර සඳහා කුඹුරු ඉඩම දක්වා පැති කාණුව ඉදිකිරීම | 50,000 | - එම - |

(ඉ) කර්තව්‍යන් ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් කර්තව්‍යන් ඉටු කිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

| කර්තව්‍ය | ඇස්තමේන්තු පිරිවැය | ආරම්භ කළ දිනය | 2017 දෙසැම්බර් 31 දිනට වියදම | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|
| | රු. | | රු. | |
| මීගම්මන පන්සලතැන්න මාර්ගය සංවර්ධනය කිරීම | 300,000 | 2017.12.28 | - | වැසි සහිත කාලගුණික තත්ත්වය නිසා ප්‍රමාද වී තිබුණි. |
| ප්‍රාදේශීය සභාවට අයත් මඩවල පැරණි මස් කඩය පිහිටි ගොඩනැගිල්ල අලුත්වැඩියාව | 400,000 | 2017.12.27 | - | 2018 අප්‍රේල් 20 දින වැඩ ආරම්භ කර ඇත. |
| උඩතලවින්න පල්ලේතලවින්න ප්‍රධාන මාර්ගය සංවර්ධනය කිරීම | 500,000 | 2017.12.27 | - | 2018 ජූනි 11 දින වැඩ ආරම්භ කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| මඩවලකඩවීදිය හපුගස්තැන්න අතුරු මාර්ගය සංවර්ධනය කිරීම | 200,000 | 2017.12.22 | - | වැසි සහිත කාලගුණික තත්ත්වය නිසා ප්‍රමාද වී තිබුණි. |
| මඩවල කඩවීදිය ගල්කැටියාවත්ත අතුරු මාර්ගය සංවර්ධනය කිරීම | 250,000 | 2017.12.22 | - | වැසි සහිත කාලගුණික තත්ත්වය නිසා ප්‍රමාද වී තිබුණි. |

(ඊ) සන අපද්‍රව්‍ය කළමනාකරණය

----------------------------------

සභා බල ප්‍රදේශයේ දෛනිකව ජනනය වන අපද්‍රව්‍ය ටොන් 02 ක් පමණ සභාවේ සේවකයන් හා ට්‍රැක්ටර් යොදාගෙන දිරන හා නොදිරන ලෙස වෙන්කර කුණ්ඩසාලේ කසළ අපද්‍රව්‍ය ව්‍යාපෘතියට යොමුකර තිබුණි.

(උ) තිරසාර සංවර්ධනය

------------------------

සභාව විසින් තිරසාර සංවර්ධන අරමුණු ඉලක්ක හඳුනාගෙන ඒවා ලඟා කර ගැනීමට හා ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශකයන් හඳුනාගෙන නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) ප්‍රාදේශීය සභාව සතු අඹතැන්න කඩ කාමර 6 ක් හා පල්ලේතලවින්න කඩ කාමර 4 ක් කෙටිකාලීනව (වර්ෂ 3 ක් සඳහා) බදු දුන්නද, වසර 3 න් 3 ට නැවතත් එකම බදුකරුවෙකුට බදු දී තිබුණු අතර, මේ සඳහා එකවර ගෙවීමේ මුදල් අය නොකිරීම හේතුවෙන් සභාවට ආදායමක් අහිමි වී තිබුණි.

(ආ) අළුත්වත්ත සන අපද්‍රව්‍ය මධ්‍යස්ථානය පාතදුම්බර හා කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභා දෙක ඒකාබද්ධව සම සමව ආදායම් හා වියදම් බෙදා ගැනීම සඳහා ගිවිසුම්ගත වී තිබුණි. එසේ වුවද, සමාලෝචිත වර්ෂයේදී පාතදුම්බර ප්‍රාදේශීය සභාව විසින් රු.7,047,210 ක පමණ වියදමක් දරා ඇතත් කිසිදු ආදායමක් ලැබී නොතිබුණි. වගකිව යුතු නිලධාරීන් විසින් මෙම ව්‍යාපෘතිය නිසියාකාරව ක්‍රියාත්මක කර ආදායම් හා වියදම් විධිමත්ව බෙදීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) පළාත් පාලන කොමසාරිස්වරයා සහ පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලබාදී තිබුණු රු.2,387,194 ක මුදලක් අදාළ කාර්ය සඳහා යොදා නොගෙන වසර 02 කට වැඩි කාලයක් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

--------------------------------------

සේවක පුරප්පාඩු

----------------------

අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය අතර සේවක පුරප්පාඩු 21 ක් විය.

3.4 වත්කම් කළමනාකරණය
------------------------------

3.4.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම
-----------------------------------------------

මඩවල නගරයේ ඇති ප්‍රාදේශීය සභාවට අයත් පර්චස් 10.9 ක ඉඩමෙන් පර්චස් 5.26 ක ප්‍රමාණයක් යාබද පදිංචිකරුවන් විසින් අනවසරයෙන් භුක්ති විඳිමින් තිබූ අතර, ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. මෙම ඉඩමේ ඉදිකර තිබූ කඩ කාමර 03 ක් වසර 10 කට අධික කාලයක සිට වසා දමා තිබුණි.

3.4.2 වත්කම් වලින් ලැබිය යුතු ආදායම් ලබා නොගැනීම
-----------------------------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) පල්ලේතලවින්න වෙළඳසංකීර්ණයේ අංක 01 දරන කඩ කාමරය දීර්ඝ කාලයක් මුද්‍රා තබා වසා ඇති අතර, ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) මඩවල වෙළඳ සංකීර්ණයේ පහත මාලයේ කඩ කාමර 10 ක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන වසා දමා තිබුණි.

(ඇ) සභාව සතු රු.16,695,000 ක් වටිනා බැකෝ යන්ත්‍රයෙන් ආදායම් උත්පාදනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.4.3 පවරා නොගත් වත්කම්
----------------------------

කුඩුගල වෙළඳ සංකීර්ණය පිහිටා ඇති පර්චස් 50 ක ප්‍රමාණයේ ඉඩම සභාවට පවරාගෙන නොතිබුණි.

3.4.4 නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්
-----------------------------------------

(අ) සභාව සතු රු.4,260,000 ක් වටිනා වාහන 4 ක් වසර 5 - 10 දක්වා පමණ කාලයක සිට නිෂ්ක්‍රීයව පවත්නා අතර, එම වාහන යථා තත්ත්වයට පත් කර ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාව විසින් මිලදීගෙන තිබූ රු. 1,295,854 ක් වටිනාකම වූ ජල උපකරණ තොගයක් දිගු කාලයක් තිස්සේ ප්‍රයෝජනයට නොගෙන ගබඩාවේ පැවතුණි.

3.5 ප්‍රසම්පාදනය
----------------

3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම
-------------------------

සමාලෝචිත වර්ෂයේදී සභාව විසින් රු.1,046,045 ක භාණ්ඩ හා සේවා මිලදීගෙන තිබූ නමුත් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

3.5.2 සැපයීම් හා සේවා
---------------------

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 6:2:2 ප්‍රකාරව ලංසු කැඳවීම් නොකර රු.46,000 ක් වටිනා ඇඹිලි සලකුණු යන්ත්‍රයක් මිලදීගෙන තිබුණි.

3.5.3 කොන්ත්‍රාත් පරිපාලනය

-----------------------------

2017 වර්ෂයේ පොදු අරමුදල් යටතේ ඉහළ යටවර සුමඟ පෙර පාසල සංවර්ධනය කිරීම සඳහා අදියර 2 ක් යටතේ රු.975,000 ක මුදලක් අනුමත වී තිබුණු අතර, ඉන් දෙවන අදියර යටතේ රු.600,000 ක ඉදිකිරීම් සඳහා 2017 සැප්තැම්බර් 11 දින උදාර ප්‍රජා සංවර්ධන සමිතිය සමඟ ගිවිසුම්ගත වී තිබුණි. මෙම ඉදිකිරීම 2018 අප්‍රේල් 19 දින භෞතික පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මෙම ඉදිකිරීම මාස 3 ක් ඇතුළතදී අවසන් කළ යුතු වුවත්, 2018 අප්‍රේල් 19 දින වන විටත් වැඩ අවසන් කර නොතිබුණි. ගිවිසුම්ගත කාලයට වඩා මාස 4 ක් ප්‍රමාද වී ඇති අතර, ඒ සම්බන්ධයෙන් ගිවිසුමේ 4 වන ඡේදය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) ගොඩනැගිල්ලේ පියන් 2 ක් සහිත වීදුරු ඇමූ ඇලුමිනියම් ජනේලයට යොදවා ඇති ලූවර්ස් බිත්තියට සවි නොවීම නිසා සිලිකන් ගම් යොදා සවිකර තිබූ බැවින් ජනේලය නියමිත ප්‍රමිතියට ක්‍රමවත්ව සවිකර නොතිබුණි.

(ඇ) පියන් දෙකේ ඇලුමිනියම් දොර සඳහා රු.67,645 ක් ඇස්තමේන්තු කර තිබුණු අතර, දොර දකුණු පස පියන් හැන්ඩ්ල් එක නිසි පරිදි සවි කර නොතිබුණු බැවින්,දොර බිත්තියට සවි වී නොතිබුණි.

(ඈ) ජනේලය දෙපස ලූවර්ස් හා දොර දෙපස ලූවර්ස් සඳහා රු.50,802 ක් ඇස්තමේන්තු කර ජනේලය දෙපස විවරයේ ලූවර්ස් යොදා ඇති නමුත්, දොර ඉහළට අඩියක් හා අඩි 4 ක් පළලට පමණක් ලූවර්ස් යොදා තිබුණි.

3.6 ආර්ථික නොවූ ගනුදෙනු

----------------------------

(අ) ඇන්තූරියම් වගාව සඳහා උපකරණ ලබා දීම

--------------------------------------------------

(i) ජම්බුගහපිටිය මණ්දන්ඩාවෙල අංක 15 පදිංචි කේ.ජී.ගුණවතී යන අයට ඇන්තූරියම් වගාව සඳහා 2017 දෙසැම්බර් 27 දින රු.35,000 ක උපකරණ ලබා දී ඇතත්, පැළ කූටිය ඉදිකර නොමැති අතර, ජී.අයි බට 7 ක් නිවසෙහි ගොඩගසා තිබුණි. සභාව විසින් ලබා දී තිබුණු මල් පෝච්චි 50 විගණනයට ඉදිරිපත් නොකළ අතර, පැළ කූටියට යෙදීම සඳහා ලබා දී තිබුණු කළු දැල ලී දඬු ආධාරයෙන් යොදවා තිබුණි.

(ii) කටුගස්තොට පල්ලේතලවින්න හපුගහ මුදුන අංක 48/2 බී පදිංචි දිල්ෂිකා චන්ද්‍රිකා කුමාරි යන අයට ඇන්තූරියම් වගාව සඳහා 2017 දෙසැම්බර් 26 දින රු.30,000 ක උපකරණ ලබා දී ඇතත්, පැළකූටිය සඳහා ලබා දී තිබුණු කළු දැල සහ ජී.අයි. බට 10 ක් ප්‍රයෝජනයට නොගෙන නිවස තුළ තිබුණු අතර, පැළ තවාන සඳහා ලබා දී තිබුණු මල් පෝච්චි 50 හි ඇන්තූරියම් නොවන වෙනත් විසිතුරු මල්පැළ සිටුවා තිබුණි.

(ආ) ස්වයං රැකියා ව්‍යාපාර සඳහා ජූකී මැෂින් ලබාදීම

------------------------------------------------------

(i) දොරගමුවේ පී.ජී.ඉන්ද්‍රාවතී යන අයට බෑග් මැසීමේ ව්‍යාපාරයක් සඳහා රු.30,000 කට ජූකී මැෂිමක් ලබා දී තිබූ නමුත්, එම මැෂිම ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

(ii) ජම්බුගහපිටිය මුණමලේ එච්.එම්.පුංචි මැණිකා යන අය සඳහා පාපිසි හා නිමි ඇඳුම් මසා අලෙවි කිරීම සඳහා මහන මැෂිමක් ලබා දී තිබූ නමුත්,

එවැනි ව්‍යාපාරයක් සිදු නොකරන බව භෞතික පරික්ෂාවේදී නිරීක්ෂණය විය.

4. ගිණුම් කටයුතුභාවය හායහපාලනය

---

4.1 අයවැය පාලනය

---

සමාලෝචිත වර්ෂය තුළදී ආදායම් හා වියදම් විෂයයන් අතර, ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුවද අයවැයගත හා තත්‍ය ආදායම් හා වියදම් අතර, සැළකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු අතර මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ආදායම් විෂයයන් 16 ක් සඳහා ඇස්තමේන්තුගත රු.954,000 කින් කිසිදු ආදායමක් උපයා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ඇස්තමේන්තුගත ආදායම් විෂයයන් 11 කින් සියයට 7 සිට සියයට 99 දක්වා ප්‍රතිශතයකින් ආදායම් අය නොවී පැවතුණි.

(ඇ) වැය විෂයයන් 46 ක් සඳහා සලසා දී තිබුණු රු.35,250,700 ක ප්‍රතිපාදන වලින් කිසිදු වියදමක් දරා නොතිබුණි.

(ඈ) වැය විෂයයන් 28 ක ශුද්ධ ප්‍රතිපාදනය හා තත්‍ය වියදම අතර සියයට 14 සිට සියයට 99 දක්වා වූ පරාසයක විචලනයක් පැවතුණි.

4.2 අභ්‍යන්තර විගණනය

---

අභ්‍යන්තර විගණනය සඳහා නිලධාරියෙක් පත්කර ඇතත්, ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

4.3 විගණන හා කළමනාකරණ කමිටු

---

2014 අගෝස්තු 08 දිනැති මධ්‍යම පළාත් පාලන කොමසාරිස්ගේ අංක සීපීසී/සීඑල්ජී/1/9/1/4 දරන ලිපිය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවා තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ කමිටු රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි.

5. පද්ධති හා පාලන

---

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| **පද්ධතිය** | **අඩුපාඩුව** |
|---|---|
| (අ) ස්ථාවර වත්කම් | (i) සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණය නොකිරීම.<br>(ii) ඇතැම් ස්ථාවර වත්කම් ප්‍රයෝජනවත් කාර්යයකට යොදවා නොතිබීම. |
| (ආ) ගිණුම්කරණය | (i) සභාව සතු සියලු වත්කම් හඳුනාගෙන ගිණුම්ගත නොකිරීම. |

| | | | |
|---|---|---|---|
| | | (ii) | සියලු ආදායම් හඳුනාගෙන ගිණුම් ගත නොකිරීම. |
| (ඇ) | වාහන පාලනය | (i) | සභාව සතු ආදායම් උත්පාදන වාහන ප්‍රයෝජනයට නොගැනීම. |
| | | (ii) | සභාවේ වාහන අනාරක්ෂිතව සභා භූමියේ හා විවිධ ස්ථානවල දමා තිබීම. |
| (ඈ) | ආදායම් රැස්කිරීම | (i) | කඩ කාමරවල තක්සේරුව ක්‍රියාත්මක නොකිරීම. |
| | | (ii) | වෙළඳ බලපත්‍ර පිළිබඳව විධිමත්ව සමීක්ෂණ නොපැවැත්වීම. |
| | | (iii) | හිඟ ආදායම් අය කර ගැනීමට නිසි ක්‍රියාමාර්ග නොගැනීම. |
| (ඉ) | ණයගැතියෝ සහ ණයහිමියෝ | (i) | කර්මාන්ත ණයහිමි ශේෂ පියවීමට කටයුතු නොකිරීම. |
| | | (ii) | ණයගැති ශේෂ අයකර ගෙන නොතිබීම. |
| (ඊ) | කොන්ත්‍රාත් පාලනය | (i) | ඉදිකිරීම් සඳහා ටෙන්ඩර් පටිපාටිය අනුගමනය නොකිරීම. |
| | | (ii) | ඉදිකිරීම්වල ප්‍රමාදවීම් පැවතීම. |